BOI
SRI LANKA

ශ්‍රී ලංකා **ආයෝජන මණ්ඩලය**

<u>භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම සඳහා</u>
<u>මිල ගණන් කැඳවීම</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ භාවිතයෙන් ඉවත් කළ පහත සඳහන් වර්ග වලට අයත් භාණ්ඩ කාණ්ඩ (Lot) වශයෙන් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| කාණ්ඩ අංක | වර්ගය | විස්තරය |
| --- | --- | --- |
| (1) | කාර්යාලීය ගෘහ භාණ්ඩ | ලී පුටු හා කාර්යාලීය මේස, Visitors Chair, Lunch Room Chairs, Revolving Chairs, කබඩ් (ලී සහ වානේ), Notice Boards, Planks (ලෑලි කැබලි), කැබිනට් හා රාක්ක |
| (2) | විදුලි උපාංග | ටෙලිෆෝන්, ෆැක්ස් මැෂින්, ශීතකරණ |
| (3) | වෙනත් | වාහන ටයර්, වීදුරු ජනේල සහිත ඇලුමිනියම් දෙරවල්, කාර්යාලීය කාපට් |

ඉහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීම කාර්යාල වේලාව තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටුනායක කලාපයේ අංක 17 දරන පලාසා ගොඩනැගිල්ලේ පළමු මහලේ සිදුකළ හැකි අතර වැඩි විස්තර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) දුරකථන අංක 011 - 2543041 / 074-1531432 ඇමතීමෙන් ලබා ගත හැක.

මිල ගණන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව කටුනායක අපනයන සැකසුම් කලාපයේ කලාප කළමනාකරණ ඒකකය වෙතින් **2023/03/27** දින ප.ව. **3:00** දක්වා ලබාගත හැක. මේ සඳහා නැවත නොගෙවන රු. 500/- + (වැට්) ගාස්තුවක් හා ආපසු ගෙවන රු. 7,500/- ක් වූ තැන්පත් මුදලක් ගෙවිය යුතුය.

භාණ්ඩ වෙන්කර ඇති කාණ්ඩය (Lot) සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර කාණ්ඩයක (Lot) කොටසකට හෝ එක් එක් අයිතම සඳහා ඉදිරිපත් කරන මිල ගණන් සළකා බලනු නොලැබේ.

මුද්‍රා තබන ලද සියලු විස්තර ඇතුළත් මිල ගණන් **2023/03/28** දින ප.ව. **2:00**ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව (II), ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කලාප කළමනාකරණ ඒකකය, කටුනායක අපනයන කලාපය, කටුනායක ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කළ යුතුය. එදිනම ප.ව. **2:00**ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර මිල ගණන් ඉදිරිපත් කරන අයට හෝ ඔහුගේ නියෝජිතයාට එම අවස්ථාවට සහභාගි විය හැක.

අදාල ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම සඳහා මිල ගණන් කැඳවීම **-2023 (Q/16/2023)"** යනුවෙන් සඳහන් කළයුතු වේ.

ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ.

සභාපති
ශ්‍රී ලංකා **ආයෝජන මණ්ඩලය**